# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,836 — 1959 අගෝස්තු 21 වැනි සිකුරාද — 21.8.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස — පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 701 |
| තනතුරු—ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — |
| අතුරු ව්‍යවසාථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| අය-වැය ලේඛන ... ... | 702 |
| දේපල විකිණීම ... ... | — |
| මාගී කොම්පි දැන්වීම ... ... | — |
| විවිධ දැන්වීම ... ... | — |


## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.ඩී—ජී.සී. 51/1.

### සුසාන භූමි හා භූමදාන කිරීම් පිළිබඳ ආඥාපනත

5 වැනි වගන්තිය යටතේ වූ නියෝගයයි

**1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති** විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත, සුසාන භූමි හා භූමදාන කිරීම් පිළිබඳ ආඥාපනතේ (181 වැනි පරිච්ඡේදය) 5 (1) වැනි වගන්තිය යටතේ පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ **ඇමතිණිය විසින් සම්පාදිත නියෝගයයි.**

විමලා විජේවර්ධන,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිණිය.

1959යේ ජූලි මස 21 වැනි දින,
කොළඹ දීය.

### නියෝගය

මීට යාකොට ඇති "බී" උපලේඛනයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තාවූ හා මායිම් නියම කර ඇත්තාවූද සීමා ඇතුළත මළවුන් භූමදාන කිරීම පිණිස හෝ ආදාහන කිරීම පිණිස හෝ මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ විස්තර කර තිබෙන ඉඩමෙහි පොදු සුසානභූමියක් මෙයින් පිහිටුවනු ලැබේ.

2. මේ නියෝගයේ 1 වැනි ඡේදය යටතේ පිහිටුවන ලද පොදු සුසාන භූමිය, සුසාන භූමි හා භූමදාන කිරීම් පිළිබඳ ආඥාපනතේ (181 වැනි පරිච්ඡේදයේ) 10, 15, 16 හා 23 වැනි වගන්තිවල බලපෑමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කළ යුතු වන්නේය.

### "ඒ" උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, නැගෙනහිර මැදපත්තු කෝරළේ මුම්මන ගමේ පිහිටි අක්කර 0, රූඩ් 2, පර්චස් 38 ක් විශාල වූද ගම්පහ, බලපත්‍ර ලත් මිණින්දෝරු නැනාවූ සී. ඇල්. වික්‍රමනායක මහතා විසින් සම්පාදිත 1958 වෙ පෙබරවාරි මස 25 වැනි දින අංක 7/58 දරණ සැලැස්මේ වැඩිදුරටත් විශේෂයෙන් විස්තරකර ඇත්තාවූද, මෙහි පහත සඳහන් පරිදි මායිම් වෙන්කොට තිබෙන 'පුස්වෙලගේන වත්ත' කියන ඉඩමේ මුළු ප්‍රදේශය; එනම්—

උතුරට: ඒ. පී. ජයතිලක මහතා විසින් අයිතිවාසිකම් කියා සිටින ඉඩමෙන්ද, නැගෙනහිරට හා දකුණට: එම ඉඩමේම ඉතිරි කොටසින්ද, බස්නාහිරට: ගම්සභා පාරෙන්ද වෙයි.

### "බී" උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමන්ගල්ල ගම්ප්‍රදේශයේ වැත්තැව ග්‍රාමයෙන් යුක්තවූ ඉඩමේ මුළු ප්‍රදේශය.

## 1946යේ අංක 57 දරණ පළාත් පාලනය (පාලන කොට්ඨාශ) පිළිබඳ ආඥාපනත

මෙහි පහත නම් සඳහන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් 1959 යේ අගෝස්තු මස 25 වැනිදා සිට මාරුකරනු ලබන බව සාමාන්‍ය මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

එනම් :—

1. ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න මහතා—පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා—බදුල්ලේ ඌව කොට්ඨාශයේ සිට කොළඹ ප්‍රධාන කාර්යාලයටය.

2. කේ. පී. ඊ. පියතිලක මහතා—වැඩබලන පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා—කොළඹ ප්‍රධාන කාර්යාලයේ සිට බදුල්ලටය. (තාවකාලික වශයෙනි).

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන කොමසාරිස්.

1959 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දීය.

## 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුළු කෝරළයේ මැද පත්තුවේ ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරිය විසින් සම්පාදනය කරණ ලද්දාවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ සියලුම කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට කුකුළු කෝරළයේ මැද පත්තු ගම් ප්‍රදේශයේ, ගම්කාර්ය සභාව විසින් 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

පී. ඞී. ඒ. චිත්‍රවතී,
සභාපතිනිය,
කුකුළු කෝරළයේ මැද පත්තුවේ ගම්කාර්ය සභාව.

ගම්කාර්ය සභා කාර්යාලය,
කලවාන, 1959 ජූලි මස 20 වෙනි දින දීය.

---

## අය-වැය ලේඛන

### වාද්දුව සුලු නගර සභාව

#### 1959 අංක 2 දරණ අතුරු වැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඞී.—1 (ඒ) සෞඛ්‍ය පරීක්ෂක ... ... | 680 | 0 |
| ඞී.—3 (එ) වේතන ... ... ... | 955 | 0 |
| ඞී.—3 (එච්) ජීවනාධාර ... ... ... | 1,855 | 0 |
| එකතුව ... | 3,490 | 0 |

1959 ජූනි මස 30 වෙනි දින පැවැත්වූ රැස්වීමේදී සභා සම්මුතියෙන් පිළිගනු ලැබිය.

ඇම්. ඞී. ඒ. ගුණතිලක,
සභාපති.

නගර සභා කාර්‍යාලය,
ජූලි මස 16, 1959.

අනුමත කරන ලදී.

ටී. ඞී. විජයරත්න,
පළාත් පාලන කොමසාරිස් වෙනුවට.

1959 අගෝස්තු 11 වෙනි දින,
කොළඹදීය.